# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,974 — 1933ක්වූ මාර්තු මස 31 වෙනි දිනවූ සිකුරාද.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාඞ්ග නීති.

බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ ආඥාපණත.

1920සේ අංක 11 දරන පළාත් ආණ්ඩුසභා සම්බන්ධ ආඥාපණතේ 245 යන වගන්තිය හා බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ අංක 25 දරණ ආඥාපණතේ 5වෙනි 6වෙනි වගන්ති යටතෙහි බේරුවල නගරබද ප්‍රදෙශසභාව විසින් සම්පාදනයකරනලද උපනීති.

ජේ. බී. ඇම්. පෙරේරා,
සභාපතිතැන.

1933ක්වූ මාර්තු මස 28වෙනි දින
බේරුවලදීය.

### උපනීති.

1. බේරුවල නගරබද ප්‍රදෙශසභාවට අයත් සීමා තුළ තබාගෙන සිටිනා සෑම බල්ලා හෝ බැල්ලී ගැන ඒ සතා රැකබලාගන්නා එසේ නැත්නම් අයිතිකාරව ඉන්නා අය විසින් බල්ලෙකුට රුපියල් 1ක් සහ බැල්ලියෙකුට රුපියල් 1·50ක් බැගින්ද ලියාපදිංචිකිරීම සඳහා අවුරුදු පතා ගෙවන ගාස්තුවක් වශයෙන් ගෙවිය යුතුය. මේ ව්‍යවස්ථාව උදෙසා අවුරුද්ද ගණින්නුලබන්නේ එක් අවුරුද්දක අප්‍රෙල් මාසයේ 1වෙනිද සිට ඊළඟ අවුරුද්දේ මාර්තු මස 31වෙනිද වනතුරුය.

2. ලියාපදිංචිකිරීමේ ගාස්තු අයකිරීම සඳහා නගරබද ප්‍රදෙශසභාවේ සභාපතිතැන විසින් පත්කොට සිටින (මෙහි මින්මතු අයකරු යනුවෙන් හඳුන්වන) තැනැත්තාට එක් එක් අවුරුද්දේ ජනවාරි මාසේ 31වෙනිදට මත්තෙන් නගරය ඇතුළත සෑම ගෙදරකම වාසයකරන්නකු විසින් ඒ ගෙදර හෝ ගෙදරට ඇතුළත් අවට භූමියෙහි හෝ තබාගෙන සිටින එක් එක් බල්ලා හෝ බැල්ලිය සම්බන්ධව විස්තර කරුණු මීට යාකොට තිබෙන A ආකෘතිපත්‍රයෙහි වුවමනාකරන පරිද්දෙන් සපයාදිය යුතුයි.

3. යටකී අයකරුට හෝ නගරබද ප්‍රදෙශසභාවේ ලේකම් තැ[illegible] අයමුදල ගෙවූවිට B ආකෘතිපත්‍රයෙහිවූ පැ[illegible] කළ බවට සහතිකයක් දෙනුලැබේ.

4 [illegible] ක් හෝ බැල්ලියක් හෝ ඉදින් :—

[illegible] වද බෝවියහැක්කේයයි අයකරු හෝ
[illegible] කරන ප්‍රමාණයකට රෝගයක්න්පෙළේ
න[illegible]

(b) වයස, ලෙඩ, තුවාල යනා මෙයින් කිසිවක් නිසා තවත් ජීවත්ව සිටින්ට සුදුසුනැතැයි තමන්ට කල්පනාවේනම්, එබඳු බල්ලකු හෝ බැල්ලියක් සඳහා ලියාපදිංචිකිරීමේ සහතිකයක් නොදෙන්නට අයකරු හෝ ලේකම්තැනට පුළුවන, නැත්නම්:

(2) ලේකම්තැන හෝ අයකරු මැනවයි සලකන කොයිම නියමයකට නමුත් යටත්කොට සහතිකයක් දෙන්නටද ඔහුට පුළුවන. එසේ සහතිකය නොදී හැරීම ගැන හෝ නියමයන්ට යටහත්කිරීම ගැන නොසතුටුවූ බල්ලන් අයිතිකාරයකුට ඊට විරුඛව නගරබද ප්‍රදෙශසභාවේ සභාපතිතැන වෙත පැමිණිලිකර සිටින්නට පුළුවන. එවිට එසේ නොදී හැරීම හෝ නියමයන්ට යටහත්කිරීම ස්ථිරකරන්නට හෝ මදක් වෙනස්කරන්නට හෝ අවලංගුකරන්නට හෝ සභාපතිතැනට පුළුවන.

5. ලියාපදිංචිකිරීමේ සෑම සහතිකයකම පහත සඳහන් නියමයන් මුද්‍රණයකොට තිබිය යුතුයි, එනම් :—

(a) සභාපතිතැනගේ කල්පනාවේ හැටියට තවත් ඉදිරියට ජීවත්ව සිටීමට සුදුසු නොවන අඳුමට බල්ලා තුවාලව හෝ රෝගාතුරව සිටීනම් එක්කෝ,

(b) ඒ බල්ලාගේ අයිතිකාරයා ඌට නිතිපතා හිරිහැර කරන බව හෝ ඌ ගැන සොයා නොබලන බව හෝ සභාපතිතැනට ඒත්තුගියේනම් එක්කෝ,

(c) ඒ බල්ලා බෝවෙන හෝ පැතිරයන ලෙඩකින් පෙළෙමින් සිටියදී අනුන්ට අයිති වෙනත් බල්ලන් හා එකට ගැවසෙන්නට ඌ අයිතිකාරයා විසින් ඉඩ හැරියේනම් මේ සහතිකය අවලංගුකරන්නට බේරුවල නගරබද ප්‍රදෙශ සභාවේ සභාපතිතැනට පුළුවන.

6. සහතිකයක් දෙන්නට බැරිය කියනුලැබ හෝ දෙනලද සහතිකයක නියමයන් අනුව ක්‍රියා නොකිරීම හේතුකොටගෙණ එය අවලංගුකරනුලැබ හෝ සිටින බල්ලකු හෝ බැල්ලියක් රැකබලාගෙන ඉන්නෙක් හෝ අයිතිකාරයෙක් හෝ විනම් ඔහු විසින් නගරබද ප්‍රදෙශසභාවෙන් ඒ සඳහා දැන්වීමක් ලත්විට එහි සඳහන් වේලාවට නගරබද ප්‍රදෙශසභාවේ කාන් තෝරුවට ඒ බල්ලා හෝ බැල්ලී ගෙණගොස් උන් බාරගන්ට බලය ලබා සිටින නගරබද ප්‍රදෙශසභාවේ නිලධාරියකුට බාර දියයුතුයි. එවිට එබඳු බල්ලන් සම්බන්ධව සභාපතිතැන නියම කරන පරිද්දෙන් ක්‍රියාකරනු ලැබේ.

### A.—ආකෘති පත්‍රයයි.

**බල්ලන් සම්බන්ධව උපනීතිවල නියමිත ලෙඛනයයි.**

**ගෙදර අංකය :——**

**වීදිය :——**

**ගෙහිමියාගේ නම :——**

| තබාගෙන සිටින බල්ලන්ගේ ගණන. | විස්තර | | | | | | අයිතිකාරයාගේ නම. | ගාස්තුව ගෙවූ දිනය. |
|---|---|---|---|---|---|---|---|---|
| | ජාතිය. | පිරිමි සතාද, ගෑනු සතාද. | පාට. | බෙල්ලේ මහත. | විශේෂ ලකුණු. | බල්ලන් කාරුණු. | | |
| | | | | | | | | මාර්තු මස 31වෙනිදා හෝ ඊට පෙර |

ආකෘති පත්‍රය බාරදුන් දවස :——.

————,
ගෙහිමියාගේ අත්සන.

19 —— දින බේරුවලදීය.

ඉහත සඳහන් ගෙහිමියා විසින් ඉහත සඳහන් ඇඹුල්පත්‍රය පුරවා, සතියක් ඇතුලත එවිය යුතුයි. එසේ නොකර පැහැර හරින යම් කෙනෙක් වීනම් ඒ අය රු. 20ක දඩයකට යටත් වියහැක.

සභාපතිතුමාගේ අණප්‍රකාර,
————,
ලේකම්.

19 —— දින බේරුවල නගරබද
ප්‍රදෙශසභා කන්තෝරුවේදීය.

---

### B.—ආකෘති පත්‍රය.

**බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකය.**

වීදිය : ——. ලියාපදිංචිකිරීමෙ අංකය : —— අංක —— දරණ නම.

ගෘහගෙහි වාසයකරණ ————, විසින් පහත සඳහන් විස්තර ඇති බල්ලකු/බැල්ලියක් මේ කන්තෝරුවෙහි ලියාපදිංචිකළ බවද, ඊට නියමවූ ගාස්තුවවූ රුපියල් ————, ගෙවූ බවද මෙහින් සහතිකකරමි.

බල්ලාගේ/බැල්ලීගේ විස්තර :——.
ජාතිය : ——.
පිරිමි සතාද ගෑනු සතාද යන වග : ——.
පාට : ——.
බෙල්ලේ මහත : ——.
විශෙෂ ලකුණු : ——.

මේ සහතිකය වර්ෂ 19 —— මාර්තු මස 31වෙනිදා වනතුරු බල සහිතව පැවතේ.

————,
ලේකම්.

වර්ෂ 19 —— ක්වූ —— වෙනි දින බේරුවල නාගරික ප්‍රදෙශසභා කන්තෝරුවේදීය.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 10,595, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 17වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට ඔළුගන්නොට සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ මැදකෝරළේ හැලඋඩපත්තු කොටසගේ පිහිටා තිබෙන බිම්කැබලි 5ක්.

ලංකාමැනීමේ මුල් සිතියමෙ නො. 260. ගම—කහටපිටිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 33 | හෝමිපොලතැන්නේ හේන්, පහලකැලේ හේන, හීන්නාරන් ගහමුලහේන, හුගේ ගාවහේන | ආණ්ඩුව සහ (1) කළුබඩල්ගේ අප්පුහාමිදේ, (2) එම ඉන්සිනූසිංදේ, (3) එම ජුවන්හාමිදේ, (4) එම රන්එකනා | හේන .. | 0 3 5 |
| 39A | දියතිරිතැන්නේමූකලාන | ආණ්ඩුව සහ දෙරේසාමි සෙල්ලම්මා .. .. | මූකලාන .. | 0 2 4 |
| 68A | නාකැටිගේමූකලාන .. | ආණ්ඩුව සහ කළුබඩලගේ රතුහාමිදේ .. .. | එම .. | 0 1 4 |
| 68B | එම .. | ආණ්ඩුව සහ එම වාසනානාහිදේ .. .. | එම .. | 0 1 5 |
| 70 | හුල්කැටිගේවතත නොහොත් අඹගහවත්ත | ලොකුහාමිදෙලාගේ හිංගිරිනාමිදේ .. .. | හේන .. | 0 3 1 |

**අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.**

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,596, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 17වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට ඔළුගන්නොට බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ මැදකෝරළේ, හැලඋඩපත්තු කොටසගේ පිහිටා තිබෙන බිම්කැබලි 12ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 287. ගම—එදතිගස්තලාව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2D | වැවගාවහේන, කුඹුරේහේන කහටයාය | ආණ්ඩුව සහ දෙහිගස්තලාවේ පදිංචි උඩපත්තුවේ මුහන්දිරම්ලාගේ කිරිඅප්පුහාමි | හේන .. | 0 0 23 |
| 2E | එම .. | එම .. .. .. | එම .. | 0 1 17 |
| 4 | වැවගාවහේන .. | ආණ්ඩුව සහ පුංචිහේවාගේ හෝරිස්සිංඤෝ .. | එම .. | 0 2 8 |
| 23 | බෝගහවත්තේහේන .. | ආණ්ඩුව සහ පකීර් මොහිදීන් මොහමදු කාසිම් .. | එම .. | 0 1 32 |
| 36B | අඹගහහේන .. | ආණ්ඩුව සහ අබ්දුල් කාදර්බාසි .. .. | එම .. | 0 2 0 |
| 36E | ගොඑවසිහේන .. | ආණ්ඩුව සහ යූනුස් ලෙබ්බෙ සේගු අබ්දුල් .. | එම .. | 0 1 4 |
| 36F | එම .. | ආණ්ඩුව සහ සෙල්ලම්මා ලෙබ්බෙ වාප්පු මරික්කාර් .. | එම .. | 0 1 2 |
| 36G | එම .. | ආණ්ඩුව සහ සේගු මොහිදීන් මොහමදු .. | එම .. | 0 1 3 |
| 36H | එම .. | ආණ්ඩුව සහ ඇම්. හරමානිස් ප්‍රනාන්දු .. | එම .. | 0 1 3 |

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 52A | පොත්තරේවත්ත .. | ආණ්ඩුව සහ අයිසිලෙබ්බෙ සේහු මොහමදු .. | හේන .. | 0 | 1 | 8 |
| 52B | රෙන්ගයේහේන .. | ආණ්ඩුව සහ ඇම්. හරමානිස් ප්‍රනාදු . | කෙත් .. | 1 | 3 | 14 |
| 45 | ගල්පොත්තේකුඹුරේවත්ත . | ජේම්ස් බෝල් ජින්ජර් .. .. | වත්ත .. | 0 | 0 | 26·6* |

* බදුදීමට පමණයි.

අක්කරයක තක්සේරු මිළ රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෝන්.
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 10,597, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 18වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට ඕලගන්තොට සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුරේ පලාතේ මැදකෝරළේ හැලඋඩපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 284. ගම—හපුගහකුඹුර.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 15 | පල්ලෙහාගෙදරවත්ත .. | ආණ්ඩුව සහ යහලවලආරච්චිලගේ ජයසුන්දර .. | වත්ත .. | 0 | 3 | 4 |
| 31C | ඔබතැන්නේහේන .. | ආණ්ඩුව සහ කරමිටිවිදානේලාගේ කිරිඅප්පුහාමි .. | හේන .. | 0 | 2 | 1 |
| 62A | වෙරළුකැපියේහේන, නාගහ ඇල්ලේහේන | ආණ්ඩුව .. .. .. | හේන සහ කෙත් | 0 | 1 | 10* |

* බදුදීමට පමණයි.

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෝන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 10,598, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 18වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට ඕලගන්තොට සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ මැදකෝරළේ, හැලඋඩපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබෙලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 290. ගම—ගලහිටියගම.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 19J | පුරහරගේගොඩහේන, මකුලේ ගාවතැන්නේහේන | ආණ්ඩුව සහ සියනෑකෝරළේ විතාරම්ලාගේ තිලක රත්නහාමි | හේන .. | 1 | 0 | 6 |
| 19K | එම .. | ආණ්ඩුව සහ බෙලිමලියද්දේගමරාලලාගේ බ්‍රාහ්මනහාමි | එම .. | 1 | 0 | 1 |
| 19L | එම .. | ආණ්ඩුව සහ (1) ඉළුක්වත්තේ රත්රන්හාමිගේ ඉසුරු හාමි, (2) එම පිංහාමි, (3) එම සුංචිඑතනා | එම .. | 4 | 0 | 6 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුර ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගතහැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෝන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 10,599, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 19වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට ඕලගන්තොට සැසිබංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ මැදකෝරළේ, හැලඋඩපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 14ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 277. ගම—දිගදුරේ.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 7A | පිටතලාවේහේන, මැදගොඩ හේන, හුගඇතුගොඩ හේන, ඇඹිල්ලවෙල් කෙටියහේන | ආණ්ඩුව සහ හැලලාගේ ඕංගිරිඋක්කු .. .. | හේන .. | 0 | 2 | 3 |
| 7B | එම .. | ආණ්ඩුව සහ දිගදුරේ පදිංචි (1) කුරුකුලසූරියගොදආරච්චිගේ කර්ලිනාහාමි, (2) එම සුබලින්, (3) එම බබාහාමි, (4) එම ඩේවිඩ් වෙනුවට ලංකාබරනකපුරාලලාගේ රම්මැනිකා | එම .. | 4 | 0 | 11 |
| 54 | නැකත්ගාරාවේහේන, බෝගහමුලහේන අරඹේවත්ත නාකොටුව | ආණ්ඩුව .. .. .. | එම .. | 2 | 1 | 4 |
| 54B | එම .. | ආණ්ඩුව සහ ගලහිටියගම ඉලුක්වත්තේ රම්මල්හාමි | එම .. | 0 | 2 | 3 |
| 54G | එම .. | ආණ්ඩුව සහ ලංකාබරනකපුරාලලාගේ පුබුදුහාමි .. | එම .. | 1 | 0 | 13 |
| 54J | එම .. | ආණ්ඩුව සහ දිගදුරේ පදිංචි වතුවාන්කුඹුරේමනත්තලාගේ ඔදිරිසා | එම .. | 1 | 0 | 3 |
| 54L | එම .. | ආණ්ඩුව සහ අසමානගේ කිරිබබා .. .. | එම .. | 0 | 3 | 3 |
| 54T | එම .. | එම .. .. .. | එම .. | 0 | 1 | 0 |
| 87B | පන්විවත්ත, වල්ගාමුල්ලේ හේන | ආණ්ඩුව සහ ගෙදිගාලගේ රට්‍රාපයා .. .. | එම .. | 0 | 1 | 14 |
| 87C | එම .. | ආණ්ඩුව සහ මැනික්විල්ලියා .. .. | එම .. | 0 | 1 | 1 |

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 91M | පුස්සැල්ගොම්මාන, වෙරළු කැට්ටෙහේන, ඉනනෑගල හේන, සින්ගන්එමාගෙ හේන | ආණ්ඩුව සහ දිගදූරේ පදිංචි වෑවිටවිදානෙලාගේ පේදුරු අප්පු | හේන | 1 | 0 | 1 |
| 91N | එම | ආණ්ඩුව සහ රුදිරිගු කිරිඅප්පුහාමි සහ කුඹ්ටාපිටියේගෙදර කිරිමැනිකෙ | එම | 1 | 0 | 5 |
| 91P | එම | ආණ්ඩුව සහ දෙඩම්පේ පදිංචි වනිගසේකරආරච්චිලාගේ අච්චදහාමි | එම | 1 | 0 | 4 |
| 91Q | එම | ආණ්ඩුව සහ මියනවල මුදියන්සෙලාගේ පුංචිමහත්මයා | එම | 1 | 0 | 5 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,600, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 19වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට ඔළුගන්තොට සැසිබංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ මැදකෝරලේ හැලඋඩපත්තු කොඩිගමගේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ මූල් සිතියමේ නො. 295. ගම—කොටුවල්පොල.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 111 | උද්දෙඹුවත්ත | තුන්කින්දදූරයාලාගේ උක්කුවා | වත්ත | 1 | 0 | 4 |
| 123 | පරගස්වත්ත | එම | එම | 1 | 0 | 11 |
| 135 | උඩගෙදරවත්ත | දිගදූරේදූරයාලාගේ කිරිමැනිකා | එම | 1 | 1 | 27 |
| 136 | වෙරළුගහකුඹුරේගොඩ හේන | ආණ්ඩුව සහ උඩගෙදරදූරයාලාගේ උක්කුවා | හේන | 0 | 3 | 31 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,601, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 18වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට ඔළුගන්තොට සැසිබංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුරේ පලාතේ මැදකෝරලේ හැලඋඩපත්තු කොඩිගමගේ පිහිටාතිබෙන බිම්කැබලි 6ක්.

ලංකාමැනීමේ මූල් සිතියමේ නො. 286. ගම—කොටුපොලතැන්න.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 7C | ගලගාවනහේන, ගොඩආරාවහේන | ආණ්ඩුව සහ රස්සගලගේ කිරිහොන්දා | හේන | 1 | 0 | 4 |
| 15N | දියහිටිතැන්නේහේන | ආණ්ඩුව සහ රස්සගලගේ බබානිසා | එම | 0 | 2 | 1 |
| 20B | පින්නලන්දේහේන | ආණ්ඩුව සහ ඔඹුවත්වල වහුම්පුරගේ කිරිබන්ඩා | පතන | 0 | 2 | 1 |
| 20E | එම | ආණ්ඩුව, මීරාලෙබ්බේ අයිදූරූස් ලෙබ්බේගේ වගාව | තේ | 0 | 1 | 38* |
| 20F | එම | එම | එම | 0 | 0 | 18* |
| 23A | පෙනරගොඩවත්ත | ආණ්ඩුව, කඩවතගේ අන්දිරිසාගේ වගාව | වත්ත | 0 | 2 | 2* |

* බදුදීමට පමණයි.

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 29වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,602, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 16වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට ඔළුගන්තොට සැසිබංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ කඩවත්කෝරලේ උඩුවග්ගම්පත්තු කොඩිගමගේ පිහිටා තිබෙන බිම් කැබලි 13ක්.

ලංකාමැනීමේ මූල් සිතියමේ නො. 378. ගම—කහරබාගේ.

| නො. | ඉඩමේනම. | ඉල්ළුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 38 | දියඇල්ලේවත්ත | බඩතුරලාගේ මහිමා | වත්ත | 0 | 1 | 6 |
| 43 | ඇහැලගෙදරවත්ත | (1) උඩගමදූරයාලාගේ රන්කිරා, (2) එම සිඤ්ඤා | එම | 0 | 1 | 22 |
| 45 | මැදගෙදරවත්ත | (1) මැදකුඹුරේදූරයාලාගේ කිරිඋක්කු, (2) එම සලෙළු, (3) එම උක්කුවා, (4) දෙල්අරාවේදූරයාලාගේ රන්කිරා | එම | 1 | 0 | 2 |
| 47 | බෝදියතැන්නේවත්ත | උඩගමදූරයාලාගේ රන්කිරා | තේ | 0 | 0 | 18 |
| 54 | පාතමැදිගේවත්ත | (1) කහවත්තේ පදිංචි ගේබ්‍රියෙල් නිකුලස්, (2) කුඹුගලයාලාගේ කිරිහටා | එම | 7 | 0 | 30 |
| 72 | පිල්ලගාවඅරාවේ ගොඩවත්ත | (1) උඩගමදූරයාලාගේ රංකිරා, (2) දෙල්අරාවේදූරයාලාගේ හටනා | එම | 3 | 0 | 27 |
| 74 | පොල්ගස්වත්ත | තුන්කින්දදූරයාලාගේ මහිමා | වත්ත | 0 | 2 | 23 |
| 75 | උඩඹිට්ටවත්ත | ඉළුක්තැන්නේ කමචි | තේ | 0 | 2 | 29 |
| 108 | පාතමැදිගේවත්ත | (1) විලියම් කුරේ සහ තවත්, (2) කහවත්තේ පදිංචි ගේබ්‍රියෙල් නිකුලස් | එම | 1 | 3 | 39 |
| 136 | කෝට්ටගොඩවත්ත | කන්නැදිගේ හෙන්ද්‍රික් සොයිසා, (2) එච්. ඇස්. සොයිසා මිහින් පෙරුතැන | එම | 1 | 1 | 20 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 140 | ගොඩම්බලාවෙවත්ත | කොරුවාගේ පීටර් ප්‍රනාන්දු .. .. .. | වත්ත | .. 0 3 4 |
| 146 | එම .. | ආණ්ඩුව, හත්නැදිගේ ජොහානිස් සොයිසාගේ වගාව .. | එම | .. 0 3 21 |
| 172 | ගන්ගේවත්ත .. | (1) ඊ. අන්තෝනි ප්‍රනාන්දු, (2) කොරුවාගේ පීටර් ප්‍රනාන්දු සහ තවත් | එම | .. 3 3 34 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 29වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 10,603, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 16වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට බෙලිහුල්ඔයේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදනවාඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ කඩවත්කෝරළේ, උඩකම්පත්තු කොටසයේ පිහිටාතිබෙන බිම්කැබලි 6ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 523. ගම—ගනේගොඩ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 11 | ආවිගලේවත්ත නොහොත් කෙහෙල්කොරටුව | (1) ඒ. එච්. ඊ. මොලමූරේ නෝනාමහත්මිය සහ තවත්, (2) ඇටවක්වල පදිංචි වීරවර්ත කුරුකුලසූරිය බුතාබදුගේ බස්තියන් ප්‍රනාන්දු | හේන් | .. 0 0 30 |
| 13 | එම .. | ඒ. එච්. ඊ. මොලමූරේ නෝනා මහත්මිය සහ තවත්, (2) ඇලවක්වල පදිංචි ඩබ්ලිව්. බී. බස්තියන් ප්‍රනාන්දු | එම | .. 0 1 8 |
| 26 | ගොඩආරවහේන .. | ගනේගොඩ විදානලාගේ රත්රන්හාමි, (2) එම කළුහාමි, (3) මුල්තැන්ගේ මුදියන්සෙලාගේ හේරත්හාමි, (4) ඒ. එච්. ඊ. මොලමූරේනෝනා මහත්මිය, (5) රවිලාදෙල පොල් වත්තේ හිංගිරිමැනිකා | එම | .. 3 1 18 |
| 32 | බැබිලවත්ත පිටදෙනිය හේන්යාය | (1) බැබිලවත්තේ පිංහාමි, (2) පඹදෙනියේ පිංහාමි, (3) මොරහැල පදිංචි හල්වින්නේ චමරලගේ කිරිඅප්පුහාමි, (4) ගනේගොඩ පදිංචි එම සවුන්මාහාමි, (5) මොරහැල පදිංචි එම අප්පුහාමි, (6) එම ගම පදිංචි එම අවසදහාමි, (7) ගනේගොඩ පදිංචි අතුකෝරලගේ මොහොට්ටිහාමි | හේන් | .. 1 1 10 |
| 33 | බන්ඩාරවත්ත .. | (1) මහබදුගේ මිගෙල් ප්‍රනාන්දු, (2) වැලිගොඩකන්කානම ලාගේ දෙන් ජූලියන්අප්පුහාමි | එම | .. 0 1 24 |
| 34 | එම .. | ඒ. එච්. ඊ. මොලමූරේ නෝනා මහත්මිය .. | එම | .. 20 3 1 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 29වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 10,604, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 24වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට බෙලිහුල්ඔයේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදනවාඇත. සබරගමු දිසාවේ රත්නපුරේ පලාතේ කඩවත්කෝරළේ උඩුවග්ගම්පත්තු කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 6ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 504. ගම—පඹගොල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 15 | අඟුරුපොළේආරාවේ වත්ත | (1) එක්නැලිගොඩ කුමාරිහාමි, (2) ඔවල කන්කානම්ලාගේ ජයසුන්දර | වත්ත | .. 0 2 8 |
| 28 | හැලවත්ත .. .. | (1) එක්නැලිගොඩ කුමාරිහාමි, (2) හැලවත්තේ හටන්කිරා, (3) කිලලාගේ කිරිබන්ඩා | එම | .. 0 2 22 |
| 30 | කොන්දරාවෙවත්ත . | (1) එක්නැලිගොඩ කුමාරිහාමි, (2) හැලඋඩගේ රන්කිරා .. | එම | .. 0 1 14 |
| 52 | එනුවාඩියේවත්ත .. | (1) එක්නැලිගොඩ කුමාරිහාමි, (2) කළුපහන කිරිබබා .. | එම | .. 0 1 8 |
| 57 | එම .. | (1) එක්නැලිගොඩ කුමාරිහාමි, (2) වැල්ලවත්තේ කිරිමැනිකා. | එම | .. 0 2 26 |
| 58 | එම .. | (1) එක්නැලිගොඩ කුමාරිහාමි, (2) තැන්නවත්තේ කිරිමැනිකා | එම | .. 0 0 30 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 29වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3තේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට ඒනම්:—කෑගල්ලේ සොහොන්භූමියලඟ රථවාහන ආදිය නවත්වන ස්ථානයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර ලෙට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

මුල් සිතියමේ 315. ගම—මැඩිල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 150 | කුනුකොටුලන්ද .. | මුඩුබිම .. | කෑගල්ලේ පදිංචි බී. එච්. වික්‍රමසිංහ මහතා | .. 0 0 4·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ මැයි 3වෙනි දින පස්වරු 2යේ කන්තෝරුවට කෑගල්ලේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 22වෙනි දින සම්බන්ධතාට කච්චේරියේදීය.

ආර්ජ්. ලීච්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හබ්බුත්කඩුව ගමේ මිනිපිට්ටනියකට පාවිච්චිකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියා කරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිංබන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 4,190 ගම—හබ්බුත්කඩුව.

| නො. | ඉඩමේ නාම. | අන්දම. | අයිතිකාරකියන්නා. | ඵිහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මීගහඇලංහේන නොහොත් ගලඋඩහේන | හේන .. | අමරකෝන්ගෙදර මුදලිහාමි, දිවිකේකරමුදියන්සේලාගේ අප්පුහාමි සහ පනස්සූරිගෙදර අප්පුහාමි | 0 3 30·2 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතසී ඉඩමට අයිතිවාසිකම් ඇක්තාවූ සැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අයවුන් 1933ක්වූ අප්‍රේල් මස 28වෙනි දින පෙරවරු 10යේ කාලයට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 28වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ඊ. එච්. ලූසැච්,
ආණ්ඩුවේ උප ඒජන්ත වහන්සේ.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

### 1931 ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 378 (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1933ක්වූ මාර්තු මස 31වන දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931 ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 1වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොබ්සෝල්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වහන්සේ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කැබැලි මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතදුම්බර කෝරළයේ පලිස්පත්තු බස්නාහිර කෝරලේ අරත්තන යන ගමේ පිහිටා තිබේ:—

I.—මුල් සිතියමේ නො. 8,681.

| බිම්කට්ටිය. | ඉඩමේ නාම. | | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 1 | දික්හින්නේපතන නොහොත් පිටකන්ද | .. | 84 | 3 | 4 |
| 3 | — | .. | 1 | 3 | 12 |
| 4 | දික්හින්නේපතන නොහොත් පිටකන්ද | .. | 44 | 3 | 6 |
| 5 | දික්හින්නේවත්ත (ගම්සහාපාරට ඉතුරුකර තිබෙන බිම) | .. | 0 | 0 | 4 |
| 9 | පිටකන්ද (ගම්සහාපාරට ඉතුරුකර තිබෙන බිම) | .. | 0 | 0 | 5 |
| 10 | එම | .. | 0 | 0 | 33 |
| 13 | දික්හින්නේපතන (ඇලට ඉතුරුකර තිබෙන බිම) | .. | 0 | 0 | 9 |
| 14 | එම | .. | 0 | 0 | 11 |
| 15 | දික්හින්නේපතන | .. | 0 | 0 | 23 |
| | | | 131 | 3 | 27 |

මීට මායිම්—උතුරට: ආණ්ඩුව විසින් තීන්දුකරණලද සැන්ට් ජෝන්ස් හිල් වත්ත (P. P 8,681/2) ගමතොල්ලේඇළ සහ නොම්මර 192,015 දරණ පිඹුරුකඩදාසියේ විස්තරවන ඉඩම.

නැගෙණහිරට: නො. 298,813 දරණ පිඹුරුකඩදාසියේ විස්තරවන ඉඩම, ආණ්ඩුව අයිතිකම්කියන පිටකන්දේපතන (P. P. 6,161/466) ආණ්ඩුව විසින් තීන්දුකරණලද දික්හින්නේවත්ත (P. P. 8,681/6), ආණ්ඩුව අයිතිකම්කියන පිටකන්ද (P. P. 8,681/8), ගෝර්ඩන්ප්‍රේසර් සහ සමාගම අයිතිකම්කියන අරත්තනවත්ත, නො. 219,086 දරණ පිඹුරුකඩදාසියේ විස්තරවන ඉඩම, ගම්සහාපාර, ගෝර්ඩන්ප්‍රේසර් සහ සමාගම අයිතිකම්කියන අරත්තනවත්ත නො. 225,221, 236,576 සහ 275,446 දරණ පිඹුරුකඩදාසිවල විස්තරවන ඉඩම්, ආණ්ඩුව විසින් තීන්දුකරණලද දික්හින්නේපතන (P. P. 8,681/12) ගෝර්ඩන්ප්‍රේසර් සහ සමාගම අයිතිකම්කියන අරත්තනවත්ත මැක්වුඩ් සහ සමාගම (ඒජන්තවරු) සහ තවත් අය අයිතිකම්කියන රක්ෂාවවත්ත.

දකුණට: නොම්මර 72,476 දරණ පිඹුරුකඩදාසියේ විස්තරවන ඉඩම.

බස්නාහිරට: කුකුල්ඔය.

II.—මුල් සිතියමේ නො. 8,681.

| බිම්කට්ටිය. | ඉඩමේ නාම. | | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 7 | ඇලඅඩියේවත්ත | .. .. | 0 | 1 | 8 |
| 8 | පිටකන්ද | .. .. | 0 | 2 | 12 |
| | | | 0 | 3 | 20 |

මීට මායිම්—උතුරට: නො. 298,813 දරණ පිඹුරුකඩදාසියේ විස්තරවන ඉඩම, පාර සහ නො. 82,989 දරණ පිඹුරුකඩදාසියේ විස්තරවන ඉඩම.

නැගෙණහිරට: නො. 82,989 දරණ පිඹුරුකඩදාසියේ විස්තරවන ඉඩම.

දකුණට: ආණ්ඩුව විසින් තීන්දුකරණලද අරත්තනවත්ත (P. P. 8,681/11).

බස්නාහිරට: ආණ්ඩුව අයිතිකම්කියන පිටකන්ද (P. P. 8,681/9) ආණ්ඩුව විසින් තීන්දුකරණලද දික්හින්නේවත්ත (P. P. 8 681/6).

---

### 1931 ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 379 (මහනුවර).

මීට යාකර තිබෙන උපලේඛනයෙහි විස්තරවන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1933ක්වූ මාර්තු මස 31වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931 ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණුලබන බවද, රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒට කටයුතුකරණ බවද, එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1932ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොබ්සෝල්,
මහනුවර පලාතේ උප ඒජන්ත උන්නාන්සේ වහන්සේ.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද. ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කෝරළයේ ගඟඉහලකෝරළේ ගිරාඋල්ල යන ගමේ පිහිටාතිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන බිම්කට්ටි, එනම්:—

උතුරට: කෑගල්ල පලාතේ සැලව ගමේ ගම්මායිම.

නැගෙණහිරට: ආණ්ඩුව අයිතිකම්කියන උනගොල්ලේහේන (P. P. 8,427/141), ආණ්ඩුව අයිතිකම්කියන යම්බහේගේවත්ත (P. P. 8,427/196), ආණ්ඩුව අයිතිකම්කියන ගම්මහේගේදෙනිය (P. P. 8,427/197), ආණ්ඩුව අයිතිකම්කියන ගම්මහේගේහේන (P. P. 8.427/198), සහ ආණ්ඩුව අයිතිකම්කියන තැන්නේහේන (P. P. 8,427/199).

දකුණට : නොම්මර 50,750 දරණ පිඹුරුකඩදාසියේ විස්තර වන ඉඩම, ආණ්ඩුව විසින් තීන්දුකරණලද වල්ලහගොල්ල නොහොත් ගැටගෝහෙල්ල (P. P. 8.667/32) සහ නොම්මර 50,750 දරණ පිඹුරුකඩදාසියේ විස්තරවන ඉඩම.

බස්නාහිරට : රුවන්කුරුව නොහොත් කුඩාඹය.

මුල් සිතියමේ නො. 8,667.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 33 | වල්ලහගොල්ල .. .. | 5 | 1 | 35 |
| 34 | එම (රුවන්කුරුවේ නොහොත් සැලව නොහොත් කුඩාඹයට ඉතුරුකරතිබෙන බිම) | 5 | 0 | 34 |
| 35 | වල්ලහගොල්ල නොහොත් ගැටකොහෙ ඇල්ලේවත්ත .. .. | 2 | 0 | 24 |
| 36 | වල්ලහගොල්ල .. .. | 0 | 1 | 28 |
| 37 | කොස්වත්ත නොහොත් වල්ලහගොල්ල (රුවන්කුරු නොහොත් සැලව නොහොත් කුඩාඹයට ඉතුරුකර තිබෙන බිම) .. | 0 | 2 | 8 |
| | | 13 | 3 | 9 |

---

1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 380 (පුත්තලම).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර් 1933ක්වූ මාර්තු මස 31වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත්නොකළොත් එකී ඉඩම රජපන්තක ඉඩම් කැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙසින් දැනුම්දෙනු ලැබේ.

වර් 1933ක්වූ ජනවාරි මස 27වෙනි දින පුත්තලමේ කච්චේරියේදීය.

ඒ. රොඩ්රිගෝ;
පුත්තලමේ ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

වයඹ දිසාවේ පුත්තලම් දිස්ත්‍රික්කුවේ දෙමලහත්පත්තුවට අයිති කිරිමැටියාපත්තුවේ ගනන්කැවේ යන ගම පිහිටි නො. 7,596 දරණ මුල් සිතියමේ පෙනෙන බිම්කට්ටි, එනම් :—

නොම්මර 7,596 දරණ මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | ගනන්කැවේකැලේ .. .. | 322 | 0 | 38 |
| 2 | එම (අතුපාරදිගට ඉතිරිකරණලද බිම්තීරය) | 1 | 3 | 20 |
| 3 | — එම (බාගේවපසරිය) .. .. | 0 | 2 | 38 |
| 4 | ගනන්කැවේකැලේ (අතුපාරදිගට ඉතිරිකරනලද බිම්තීරය) .. .. | 0 | 3 | 14 |
| 5 | — එම (බාගේවපසරිය) .. .. | 0 | 1 | 13 |
| 6 | විරවල .. .. | 0 | 2 | 23 |
| 7 | ගනන්කැවේවැව .. .. | 13 | 0 | 14 |
| 8 | — (වියලිඇල) .. .. | 0 | 1 | 8 |
| 9 | ගනන්කැවේකැලේ .. .. | 60 | 2 | 10 |
| 10 | එම (වැව්බැම්ම සහ හොරොව්ඇලදිගට ඉතිරිකරනලද බිම්තීරය) .. .. | 0 | 1 | 20 |
| 11 | හොරොව්ඇල .. .. | 0 | 1 | 10 |
| 12 | ගනන්කැවේකැලේ (වැව්බැම්ම සහ හොරොව්ඇලදිගට ඉතිරිකරණලද බිම්තීරය) .. | 1 | 0 | 24 |
| 13 | එම (හොරොව්ඇල දිගට ඉතිරිකරනලද බිම්තීරය) .. .. | 1 | 3 | 14 |
| 14 | එම ( එම ) .. | 1 | 2 | 30 |
| 15 | ගනන්කැවේකැලේ .. .. | 9 | 1 | 14 |
| 17 | ගනන්කැවේවෙල .. .. | 1 | 2 | 13 |
| 18 | — (බැම්ම) .. .. | 0 | 0 | 24 |
| 19 | — (වියලිඇල) .. .. | 0 | 0 | 5 |
| 20 | ගනන්කැවේකැලේ .. .. | 0 | 0 | 35 |
| 21 | — (බැම්ම) | 0 | 0 | 22 |
| 22 | ගනන්කැවේකැලේ (ගම්සභාපාරදිගට ඉතිරිකරනලද බිම්තීරය) .. .. | 0 | 1 | 28 |
| 23 | — (ගම්සභාවපාර) .. .. | 0 | 2 | 30 |
| 24 | ගනන්කැවේකැලේ (ගම්සභාපාරදිගට ඉතිරිකරනලද බිම්තීරය) .. .. | 0 | 1 | 20 |
| 25 | — (බැම්ම) .. .. | 0 | 0 | 12 |
| 26 | ගනන්කැවේකැලේ .. .. | 21 | 1 | 28 |
| 27 | එම .. .. | 0 | 3 | 32 |
| 28 | එම (අඩිපාරකට ඉතිරිකරනලද බිම්තීරය). | 0 | 0 | 8 |
| 29 | ගනන්කැවේකැලේ .. .. | 4 | 1 | 10 |
| 30 | සියඹලාගහහේන .. .. | 5 | 3 | 36 |
| 31 | එම (වැව්බැම්මදිගට ඉතිරිකරනලද බිම්තීරය) | 0 | 1 | 29 |
| 32 | ඉත්තැවැටුනුවැව .. .. | 1 | 2 | 29 |
| 33 | ගනන්කැවේකැලේ (අඩිපාරකට ඉතිරිකරනලද බිම්තීරය) .. .. | 0 | 0 | 14 |
| | | 453 | 3 | 25 |

අතහත්කරනලද කොටස.

| | | | | |
|---|---|---|---|---|
| 16 | ගනන්කැවේවෙල .. .. | 2 | 3 | 34 |

ඉහත සඳහන් ඉඩම්වලට මායිම්—උතුරට නවගත්තේගම සිට කිරිමැටියාවට යන පාර, පුල්ලෑව (පාලු), කිරිමැටියාවේ ගම්මායිම, මල්මඩුගම සිට ගල්ගමුවට යන පාර සහ (මල්මඩුගම ගම්මායිමද) ; නැගෙනහිරට පලුගස්වැව ගම්මායිම ; දකුණට රඹකනයාගම ගම්මායිම සහ බස්නාහිරට කිරිමැටියාවේ ගම්මායිමද වෙත්.

---

1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 381 (පුත්තලම).

මීට යාකර තිබෙන උප ලේඛනයේ විස්තරවන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර් 1933ක්වූ මාර්තු මස 31වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර් 1933ක්වූ පෙබරවාරි මස 6වෙනි දින පුත්තලමේ කච්චේරියේදීය.

ඒ. රොඩ්රිගෝ,
පුත්තලමේ ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

වයඹ දිසාවේ පුත්තලම් දිස්ත්‍රික්කුවේ පුත්තලමේ නගර සීමාව තුළ (දැනට පුත්තලමේ පලාතේ ආණ්ඩුසභා සීමාව තුළ) පිහිටි නොම්මර 7,623 දරණ මුල් සිතියමේ මෙහි පහත සඳහන් බිම්කට්ටි, එනම් :—

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | නැඳුන්කුලමරවෙකානි .. | 20 | 3 | 33 |
| 2 | කඩම්යන්කුලම්වියල් .. .. | 1 | 1 | 1 |
| 3 | අම්බලකාරන්කුලම් .. .. | 6 | 2 | 26 |
| | | 28 | 3 | 20 |

ඉහත සඳහන් ඉඩම්වලට මායිම්—උතුරට නැඳුන්කුලම වැව සහ ටී. පී. 51,455හි සඳහන් ඉඩමද ; නැගෙනහිරට ඇස්. ඒ. ඇම්. හනීපා මරික්කාර් සහ තවත් අය අයිතිකම්කියන කඩම්යන්කුලන්කානි ; දකුණට ඒ. ඇස්. මොහිදීන් සහ තවත් අය සහ කේ. ඇම්. පකීර් පිච්චෙ සහ තවත් අය අයිතිකම් කියන කඩම්යන්කුලම්වයල්ද, ඇස්. ඒ. කේ. අහමදු නෙයිනා මරික්කාර් විසින් අයිතිකම්කියන අම්බලකාරන්කුලමරව කානි සහ බස්නාහිරට ඇස්. ඒ. කේ. අහමදු නෙයිනා මරික්කාර් අයිතිකම්කියන අම්බලකාරන්කුලමරවකානිද, පී. ඇම්. ඒ. ඇන්. මරික්කාර් සහ තව අය අයිතිකම්කියන වෙට්ටු කුලම්කානිද වෙත්.

---

මැණික්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන්රජසන්තක ඉඩම්වල අවුරුද්දක් තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. “ Tender for the right to gem ” එනම් “ මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය ” යන වචන ඇන්වලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර් 1933ක්වූ අප්‍රේල් මස 26වෙනි දින පෙරවරු 10ය වන

තුරු භාරගනිමින් කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසිබලයලත් ඒජන්තකෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරවන්ට ඕනෑය.

3. ඉඩම් සම්බන්ධ කොමසාරිස් උන්නාන්සේ වෙත ඔප්පු කිරීම පිණිස ඒජන්ත උන්නාන්සේ විසින් තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවෙලේම ගෙවන්ට ඕනෑය. තවද ඉඩම් සම්බන්ධ කොමසාරිස් උන්නාන්සේ විසින් ඉල්ලීම භාරගන්ට යෙදුනොත් කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් බව දන්වන්ට යෙදුන දින සිට මාස තුනක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබානොගත්තේනම් ඔහු විසින් ගෙවනලද මුදල රජසන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගු කාලය තුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලැක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තමතමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩ පවත්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්ෂකතැන වෙත දන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතැන පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. වැඩිදුර කරුණු සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

### ඉඩම්වල තොරතුරු.

1. නවදුන්කෝරළේ කෙහෙල්ඔවිටිගමේ දිගින් දම්වැල් 30ක් ඇති ගුරුදෙල් කොටසට මායිම් :—උතුරට : නො. 2BG දරන බිම්කට්ටියේ උතුරු නැගෙනහිර මායිම ; නැගෙනහිරට : ගුරුදෙල් වම් ඉවුර ; දකුණට : පාතගම ගම්මායිම ; බස්නාහිරට : ගුරුදෙල් දකුණු ඉවුර.

2. කුරුවිටිකෝරළේ මැදගම පිහිටි අක්කර බාගයක් විසාලකම ඇති නො. 351 දරන සිතියමේ නො. 37 දරන බිම්කට්ටිය වන වැකඩමූකලානේ කොටසට මායිම් :—උතුරට සහ නැගෙණහිරට: මුරුතැන්ඇල ; දකුණට: පුස්සේඇල ජෝදර, නො. 351 දරන සිතියමේ නො. 37 දරන බිම්කට්ටියේ කොටස සහ එම සිතියමේ නො. 71 දරන බිම්කට්ටිය ; බස්නාහිරට නො. 351 දරන සිතියමේ නො. 37 දරණ බිම්කට්ටිය.

3. කුරුවිටිකෝරළේ නාපාවල පිහිටි දිගින් සැතැප්ම 1¼ක් ඇති නාගහඇලේ කොටසට මායිම් :—උතුරට : ගොඩකැලේ සහ ගම්මුන්ගේ ඉඩම් ; නැගෙණහිරට : ඉද්දමල්ගොඩ සිට පිටිපොලට යන පාර ; දකුණට : ගොඩකැලේ සහ ගම්මුන්ගේ ඉඩම් ; බස්නාහිරට : ගල්වලවත්තේ සිට දෙල හරහා දෙල්වත්තට නොහොත් ඔරුවලගාවා වත්තට යන පාර.

4. කුරුවිටිකෝරළේ කුරුවිට පාතගම පිහිටා තිබෙන නො. 255 දරන සිතියමේ නො. 8 දරන බිම්කට්ටියේ කොටසක්වන අක්කර 2ක් විසාලකම ඇති හද්දගහහේනේ මූකලානට මායිම් :—උතුරට: නො. 8 දරන බිම්කට්ටියේ කොටසක් ; නැගෙණහිරට : පැද්දිමලදෙනිය ; දකුණට සහ බස්නාහිරට : නො. 8 දරන බිම්කට්ටිය.

5. නවදුන්කෝරළේ කිරිබත්ගල පිහිටි අක්කර 11යි පර්චස් 16ක් විසාලකම ඇති නො. 26 දරන සිතියමේ නො. 29G දරන බිම්කට්ටියවන නකල්දෙනියේහේන්යාය, යමනුන්හේන, නමැති ඉඩමේ සිට උතුරට රේල්පාර අයිනේ දිගටම අඩි 10ක් අත්හැර ඉතිරිකොටසට මායිම් :—උතුරට: රේල්පාර, නො. 29G6 දරන බිම්කට්ටිය, යමනුන්හේන, නො. 29G8 දරන බිම්කට්ටිය, රබර්වත්ත, නො. 29G13 දරන බිම්කට්ටිය ; නැගෙණහිරට : නො. 29G8ට සහ 29G5 දරන බිම්කට්ටි ; දකුණට : දෙවෙල්දෙල සහ වේගහ ; බස්නාහිරට : රබර්වත්ත ; නො. 29G18 දරන බිම්කට්ටිය.

6. නවදුන්කෝරළේ කිරිබත්ගල පිහිටි නො. 26 දරන සිතියමේ නො. 29H දරන බිම්කට්ටියවන අක්කර 16 පර්චස් 4ක් විසාලකම ඇති වලකඩවත්තේ හේන්යායට මායිම් — උතුරට : නො. 34 දරන බිම්කට්ටිය, මහවිටවත්ත ; නැගෙනහිරට : නො. 29A4 දරන බිම්කට්ටිය, කිරිබත්ගල රබර් වත්ත ; දකුණට සහ බස්නාරට : වේගහ.

7. නවදුන්කෝරළේ කිරිබත්ගල පිහිටි අක්කර 2 පර්චස් 20ක් විසාලකම ඇති නො. 26 දරණ බිම්කට්ටියේ නො. 29G8 දරන බිම්කට්ටියවන යමනුන්හේන නමැති ඉඩමේ සිට උතුරට රේල්පාර අයිනේ දිගටම අඩි 10ක බිම්තීරුවක් අත්හැර ඉතුරු කොටසට මායිම් :—උතුරට : නො. 29G6 දරණ බිම්කැබෙල්ල, රේල්පාර ; නැගෙණහිරට : නො. 29G9 දරන බිම්කැබෙල්ල, යමනුන්හේන ; දකුණට : නො. 29G5 අන්නක්කාගලහේන, නො. 29G නකල්දෙනියේ හේන ; බස්නාහිරට : නකල්දෙනියේහේන, ලොට් 29G.

8. නවදුන්කෝරළේ කිරිබත්ගල පිහිටි අක්කර 2 රූඩ් 2 පර්චස් 39ක් විසාලකම ඇති නො. 26 දරන සිතියමේ නො. 29I දරණ බිම්කට්ටියවන හෙලඋඩහේන නමැති ඉඩමේ සිට උතුරට රේල්පාර අයිනේ දිගටම අඩි 10ක බිම්තීරුවක් අත්හැර ඉතිරිකොටසට මායිම් :—උතුරට සහ නැගෙණහිරට : නො. 29I6 දරන බිම්කට්ටිය, රේල්පාර ; දකුණට : නො. 29A4 දරන බිම්කට්ටිය, කිරිබත්ගලවත්ත, නො. 29I5 දරණ බිම්කට්ටිය, මහවිටහේන සහ ලොට් නො. 32 දරන නැකවිටියේවත්ත ; බස්නාහිරට : ලොට් නො. 29I8 දරන හෙලඋඩහේන සහ ලොට් නො. 29AI දරන රේල්පාර.

9. නවදුන්කෝරළේ බලිබත්ගොඩ පිහිටි අක්කර 3 පර්චස් 5ක් විසාල ඇති නො. 51 දරන සිතියමේ ලොට් නො. 6C දරන පොත්ගුල්කන්දේමූකලානට මායිම් —උතුරට : නො. 51 දරන සිතියමේ ලොට් නො. 25 දරන බිම්කැබෙල්ල; නැගෙණහිරට : මූවගම ගම්මායිම ; දකුණට : වැරනියගොඩ ගම්මායිම ; බස්නාහිරට : වැරනියගොඩ ගම්මායිම සහ නො. 51 දරන සිතියමේ ලොට් නො. 25 දරන බිම්කැබෙල්ල.

ජේ. එච්. පෙරේරා,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 21වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

---

### සුප්‍රිම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් ගාල්ල, මාතර සහ තංගල්ල දිසාවල ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1933ක්වූ අප්‍රෙල් මස 25වෙනි දින පෙරවරු 11 පැය පටන් ගාල්ලේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණී සිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සෑම දෙනාටම දන්වන්නෙමි.

ජේ. බී. බ්‍රවුන්,
දූ. ප. පිස්කල් වම්ශ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 24වෙනි දින
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.